# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/19 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පාර්ලිමේන්තු මැතිවරණ කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල හෝ දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට *නැතහොත්* අගතියට හේතුවන හෝ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හෝ වක්‍ර ලෙස යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(4)(අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන, රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල හෝ දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට *නැතහොත්* අගතියට හේතුවන හෝ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හෝ වක්‍ර ලෙස යොදා ගැනීම වැළැක්වීම සඳහා මතු සඳහන් විධාන මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 25 දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

"මැතිවරණය පැවැත්වෙන කාලසීමාව තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ රාජ්‍ය අධිකාරියකට හෝ රජය සතු සමාගමකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්"යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයෙක් හෝ තෝරාපත් කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළකාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(4)(අ) අනු ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව සතු ය. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(4)(අ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන එකී නියමයන් ක්‍රියාත්මක කිරීමට එම ව්‍යවස්ථාවේ (ආ) අනුව්‍යවස්ථාව අනුව රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී. එබැවින් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන් මෙම විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය. එමෙන්ම ස්වකීය පාලනය යටතේ ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම නියමයට අනුකූලව ක්‍රියාකරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මෙම විධාන රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කොමිෂන් සභා ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, සමූපකාර, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය අධිකාරි, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල, රජයට පවරාගත් සමාගම් යන සියලුම ආයතන හා 50%කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතනවලට ද බලපැවැත්වේ.

**02. නිලධාරීන්**

2.1 සියලු රජයේ නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා ඔවුන්ගේ කාලය ද රාජ්‍ය දේපළක් ලෙස සැලකෙයි. එබැවින්;

2.1.1 දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයකු වුවද රාජකාරී වේලාව තුළ දී සිය කාර්යාලයේ හෝ කාර්යාල පරිශ්‍රය තුළ හෝ විධිමත් පරිදි නිවාඩු ලබාගෙන නොමැති නම් කාර්යාලයෙන් බැහැරව හෝ දේශපාලනමය ප්‍රවර්ධන කටයුතුවල නොයෙදිය යුතු ය.

2.1.2 දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නිවාඩු ලබාගෙන හෝ කිසිදු දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු ය.

2.1.3 දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයෙකු තම පෞද්ගලික සමාජ ජාල ගිණුමක් හෝ වෙනත් ගිණුමක් භාවිතා කරමින් යම් දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන කිසිදු ප්‍රචාරණයක් හෝ ප්‍රකාශයක් සිදු කිරීම වරදක් වන්නේය.

2.1.4 දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරියෙකු වුවද එම ප්‍රචාරණ හා ප්‍රකාශ සඳහා රජයේ සම්පත් භාවිතා කරමින් කාර්යාල වේලාව තුළ දී ප්‍රචාරණ කටයුතු සිදුකිරීම නොකළ යුතු අතර,පෞද්ගලික සමාජ ජාල ගිණුම් මගින් හෝ යම් දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක්, අපේක්ෂකයෙක්, මැතිවරණය සම්බන්ධයෙන් අසත්‍ය පුවත්, දුස්තොරතුරු සහ හිතා මතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරු ව්‍යාප්තියට හෝ ප්‍රසිද්ධියට හෝ පත් කිරීමට ඉඩ හැරීම වරදකි.

2.2 දේශපාලනමය කටයුතු රාජ්‍ය දේපළ අයුතු ලෙස පරිහරණය වැලැක්වීම.

2.2.1 කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දේශපාලනමය කටයුතු සඳහා රාජ්‍ය දේපළ එනම්, වාහන, ප්‍රචාරක උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මාධ්‍ය උපකරණ, දුරකථන පහසුකම්, ලිපි ද්‍රව්‍ය, සංචාරක නිවාස යනාදී රජය සතු කිසිවක් හෝ වෙනත් රජයේ සේවකයෙක් හෝ දේශපාලන කටයුතු සඳහා යොදවා ගැනීමේ හිමිකමක් හෝ රජය සතු කිසිවක් භාවිතා කිරීමේ හිමිකමක් හෝ නොමැත.

2.2.2 පාර්ලිමේන්තු මැතිවරණය හා සබැඳි රාජ්‍ය දේපළ අවභාවිත කිරීම වැළැක්වීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇති විධානයක් හෝ විධාන කඩවී ඇති බවට කොමිෂන් සභාව වෙත ලැබී ඇති තොරතුරු හෝ පැමිණිලි හෝ පිළිබඳව වැඩිදුරටත් කරුණු විමසා බැලීම අවශ්‍ය බව මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරනු ලබන විටෙක දී, ඒ සඳහා අවශ්‍ය වන මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ලිපි ලේඛන, සාකච්ඡා සටහන්, වාර්තා, බඳවා ගැනීම්, හෝ පත්වීම් ලබා දීමට අදාළ වාර්තා යනාදී තොරතුරු කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන නිලධරයෙකුට හෝ ලබා දීමට නියෝග කළ විටෙකදී එකී තොරතුරු ලබාදීමට එම ලිපි ලේඛන භාරව සිටින නිලධාරීන් කටයුතු කළ යුත්තේ ය. එවැනි විටෙකදී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති යම් විධානයක් හෝ විධාන කඩ කර ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු විමසා බැලීම සඳහා වාචික හෝ ලිඛිත හෝ ප්‍රකාශ ලබාදෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව

හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් බලය පැවරූ නිලධරයෙකු හෝ නියම කළ විටකදී සියලු කරුණු ඇතුළත් ප්‍රකාශ ලබා දීමට එකී කරුණු හා සම්බන්ධිත රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුතු ය. එසේ කිරීමට එකී නිලධාරීන් බැඳී සිටී.

2.2.3 පාර්ලිමේන්තු මැතිවරණය හා සබැඳිව රාජ්‍ය දේපළ අයුතු පරිහරණය හා සම්බන්ධිත විධාන කඩ කිරීම් පිළිබඳව කරුණු විමසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් යම් රාජ්‍ය නිලධාරියෙකු මැතිවරණ කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබූ විටක දී ඒ සඳහා පැමිණ අවශ්‍ය සියලු කරුණු පැහැදිලි කර දීමට හා අවැසි සියලු ලිපි ලේඛණ ඉදිරිපත් කිරීමට එම කැඳවීම ලද රාජ්‍ය නිලධරයා ක්‍රියා කළ යුත්තේ ය. එසේ කිරීමට එකී නිලධරයා බැඳී සිටින්නේ ය.

2.3 නිලධාරීන් බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම්

2.3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත්කර ඇති කොමිෂන් සභාවල බලතල යටතේ නියමිත පරිපාටියට අනුකූලව සිදු කරන බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් ඇතුළුව මෙම කාල සීමාව තුළදී රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

2.3.2 කෙසේ නමුදු පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් හෝ අභ්‍යන්තර උසස් කිරීමේ වැඩපිළිවෙලක් කල් දැමීමකින් තොරව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පවතින බව අමාත්‍යාංශ ලේකම්වරුන් හෝ ආයතන ප්‍රධානීන් අදහස් කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් විධිමත්ව හා දේශපාලන මැදිහත්වීම්වලින් තොරව කෙරෙන බවට අදාළ බලධාරීන්ට නිසැක විය හැකි විටදී ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලබාදිය හැකි ය. එවැනි අවස්ථාවල දී ඒ සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

2.3.3 සනීපාරක්ෂක, පිරිසිදු කිරීම් සේවා හා නඩත්තු කටයුතු බිඳවැටීම වැළැක්වීම සඳහා හා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑම සඳහා ප්‍රාදේශීයව හෝ පළාත්බදව හෝ රාජ්‍ය සේවයට සේවකයන් බඳවා ගැනීම සිදු කරන්නේ නම්, එවැනි බඳවා ගැනීම් වුවද මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව මත සිදු කළ යුතු අතර කිසිදු දේශපාලනමය මැදිහත්වීමකින් තොරව විනිවිද බවින් යුතුව එවැනි කටයුතු සිදු කිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත පැවරේ.

2.3.4 මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් නාමයෝජනා කැඳවීමේ දැන්වීම් දින සිට පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වී සති දෙකක් යන තුරු අත්හිටුවිය යුතු ය.

2.3.5 මැතිවරණ රාජකාරි සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල නිලධාරීන් වුවද මැතිවරණ කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතුන් මත එකී ස්ථාන මාරුවීම් සිදු නොකළ යුතු අතර එසේ සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීම සියලුම බලධාරීන්ගේ වගකීම වේ.

2.3.6 විධිමත් විනය නියෝග මත සිදු කෙරෙන ස්ථාන මාරුවීම් සඳහා මෙම නියමය බල නොපැවැත්වෙන අතර විශේෂ අවස්ථාවල දී හෝ සේවා අවශ්‍යතා මත හෝ ස්ථාන මාරුකිරීම් සිදු කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී පූර්වයෙන් අනුමැතිය ලබාගත යුතු ය.

2.4 තැපැල් ඡන්ද ලකුණු කිරීම හා සම්බන්ධ වැරදි ක්‍රියා වැලැක්වීම

2.4.1 මැතිවරණ කොමිෂන් සභාව විසින් තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළට රැගෙන යෑම තහනම් කර ඇති කිසිදු උපකරණයක් රැගෙන යෑම හෝ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය නිලධාරීන් විසින් නොකළ යුතු ය.

2.4.2 රාජ්‍ය නිලධරයන් විසින් තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ දී එම ඡන්ද පත්‍රිකාව හෝ සලකුණු කරන ලද ඡන්දපත්‍රිකාව හෝ ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රදර්ශනයට ඉඩ සැලසීම, ඡන්ද පත්‍රිකාව ඡායාරූපගත කිරීම හෝ එකී ඡයාරූපයේ දර්ශන ප්‍රසිද්ධ මාධ්‍ය වෙත නිකුත් කිරීම හෝ සමාජ මාධ්‍ය ජාල වෙත උඩුගත කිරීම වරදක් වන්නේ ය.

2.4.3 තැපැල් ඡන්ද මධ්‍යස්ථානය ඡායාරූපගත කිරීම හෝ එකී ඡයාරූපයේ දර්ශන ප්‍රසිද්ධ මාධ්‍ය වෙත නිකුත් කිරීම හෝ සමාජ මාධ්‍ය ජාල වෙත උඩුගත කිරීම ද වරදක් වන්නේ ය.

**03. උත්සව, ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන**

**3.1 උත්සව**

3.1.1 මැතිවරණ කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, ජනතා අයිතියට පැවරීම් වැනි උත්සව දේශපාලනඥයන්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අවස්ථාවල දී පාර්ලිමේන්තු මැතිවරණ අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වන බැවින් සහ මෙවැනි අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීම හරහා යම් පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමක් හෝ වෙනත් පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයකුටඅගතියක් සිදු විය හැකි හෙයින්, මෙම මැතිවරණ කාලය තුළ එබඳු උත්සව හා කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැලකී සිටිය යුතු ය.

3.1.2 පාර්ලිමේන්තු මැතිවරණ නිවේදනය නිකුත් කිරීමට පෙර දින නියම කරන ලද එවැනි උත්සව අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නොමැති නම් එවැනි උත්සව පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබාගත යුතුවේ. යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි උත්සව පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී කිසියම් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදු වුවහොත් ඒ පිළිබඳව උත්සවය සංවිධානය කරන ලද නිලධාරීන් වග කිවයුතු ය.

3.1.3 මැතිවරණ කාලය තුළ පැවැත්වෙන මෙවැනි උත්සව සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතු ය.

3.1.4 පවත්වනු ලබන උත්සවයක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා හෝ අගතියට පත් කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදු කිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් වන අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ උත්සව සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

**3.2 ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන**

3.2.1 ජනතාවට සේවා සැපයීමේ අරමුණින් රාජ්‍ය මුදල් හා රාජ්‍ය දේපළ වැය කරමින් පැවැත්වෙන මෙවැනි ජංගම සේවා හා වෙළඳ ප්‍රදර්ශන හරහා ද පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන් සිදුකිරීමේ ප්‍රවණතාවක් පවතින හෙයින්, මෙම මැතිවරණ කාලය තුළ එබඳු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදී කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතුය.

3.2.2 මැතිවරණ නිවේදනය නිකුත් කිරීමට පෙර සංවිධානය කරන ලද එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි, අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නොමැති නම් පමණක් එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබා ගත යුතු වේ. යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්කිරීම් සිදුවුවහොත් ඒ පිළිබඳව අදාළ කාර්යය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව යුතු ය.

3.2.3 මැතිවරණ කාලය තුළ පැවැත්වෙන මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතුය.

3.2.4 කිසිදු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙලියක දී හෝ එවැනි වෙනත් අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා *නැතහොත්* අගතියට පත්කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදුකිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ කාර්යය සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

**04. පහසුකම්, ප්‍රදාන ලබාදීමේ වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

4.1 ජනතාවට පහසුකම් සැලසීම සඳහා හෝ රටේ සංවර්ධනය සඳහා සිදුකරන දීර්ඝකාලීන හෝ මධ්‍යකාලීන විශේෂ ව්‍යාපෘති හෝ පහසුකම් ලබාදීමේ අඛණ්ඩ වැඩ සටහන් මැතිවරණය හේතුවෙන් අත්හිටුවිය නොහැකි නමුත් මැතිවරණ නිවේදනය නිකුත් කිරීමෙන් පසු මෙවැනි විශේෂ ව්‍යාපෘති හෝ අඛණ්ඩ වැඩ සටහන් හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම් හෝ අගතියට පත්කිරීම් සඳහා යොදා ගැනීමට ඉඩ නොදිය යුතුය.

4.2 මැතිවරණ කාල සීමාව තුළ රජයේ ඉඩම් බෙදාදීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, මුලුතැන්ගෙයි උපකරණ, ගෘහ උපකරණ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්යබල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල්, සහනාධාර ලෙස මුදල් ප්‍රදානය කිරීම, සලාක ලෙස සහල් හෝ වෙනත් වියළි හෝ පිසින ලදහෝ ආහාර ලබාදීම යනාදී වැඩසටහන් ආරම්භ කිරීම අත්හිටුවිය යුතුය. එසේ අත්හිටුවීම නිසා ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීමට බාධාවක් ඇතිවන බව පෙනී යන්නේ නම්, ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා උපදෙස් ලබාගත යුතු ය. යම් හෙයකින් දැනටමත් ආරම්භ කර ඇති හෝ අනුමැතිය ලබාදෙන මෙවැනි වැඩසටහන් හෝ කාර්යයන් අඛණ්ඩව සිදුකිරීමට සිදුවුවහොත් එකී කාර්යයන් එම විෂයභාර නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් කිසිදු පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂකයන් ප්‍රවර්ධනයක් *නැතහොත්* අගතියට පත්කිරීමක් සිදු නොවන පරිදි ක්‍රියාත්මක කිරීම එම කාර්යයන් හා වැඩසටහන් භාර නිලධාරීන්ගේ වගකීම වේ.

**05. රාජ්‍ය දේපල සන්තකය දරන රජයේ සහ රාජ්‍ය ව්‍යවස්ථාපිත, සංස්ථා, මණ්ඩලවල ප්‍රධානීන්ගේ වගකීම**

5.1 සෑම රාජ්‍ය ආයතනයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක, අධිකාරියක, මණ්ඩලයක හා රජයට 50% කට වැඩි කොටස් අයත් ආයතනයක රාජ්‍ය සම්පත්වල වගකීම හා අධීක්ෂණය සඳහා නිලධාරියකු බැගින් නම් කළ යුතුය.

5.2 රාජ්‍ය ආයතනකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට, අධිකාරියකට හා මණ්ඩලවලට රාජ්‍ය සමාගම්වලට අයත් දේපල, කිසිදු දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකු ගේ ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන අයුරින් භාවිතා කිරීමට ඉඩ ලබා නොදිය යුතුය. ආයතනයකට අයත් රාජ්‍ය දේපළ දේශපාලන කාර්යයන් සඳහා භාවිතයට ගැනීම වැළැක්වීම එකී ආයතනවල ප්‍රධානීන්ගේ වගකීමක් වන අතර, මෙම රාජ්‍ය දේපළ භාවිතයට ගැනීම වැළැක්වීමට අදාළ විධිවිධාන මෙම එක් එක් ආයතනවල ප්‍රධානීන් විසින් සිදුකළ යුතුය. මෙම විධාන නිසිලෙස ක්‍රියාත්මක නොකරනු ලබන රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට එරෙහිව එකී විධාන කඩ කිරීම මැතිවරණ වරදක් කළ සේ සලකා කටයුතු කරනු ලැබේ.

**06. වාහන**

6.1 රජය සතු මෝටර් රථ, ජීප් රථ, කැබ් රථ, බස් රථ ආදී සියලුම රජයේ වාහනවලට අදාළ සංචිත භාරව සිටින නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාලසීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම හා වෙන්කරදීම් විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු ය. නිලධාරීන්ට වෙන් කර ඇති රජය සතු වාහන (Assigned Vehicles) සහ වෙනත් බාහිර පාර්ශව වෙතින් කුලී පදනම මත ලබාගෙන රාජකාරි කටයුතු සඳහා යොදවන වාහන ද (Hired Vehicles) මීට ඇතුළත් වන බව සැලකිය යුතු ය. මෙම කාලසීමාව තුළ දී නිලධාරීන්ට වෙන් කර ඇති වාහන හැර (Assigned Vehicles) විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන (Pool Vehicles) සහ අනෙකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගතයුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය. රාජකාරි

කටයුතු සඳහා යෙද වූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් හෝ එවැනි අනීතික කාර්යයන් සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතු ය.

6.2 ජනාධිපතිවරයාගේ ආරක්ෂක අංශය සඳහා වෙන්කර ඇති වාහන දෙකකට හැර වෙනත් කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන්කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු කැබිනට් අමාත්‍යවරයෙකුට, රාජ්‍ය අමාත්‍යවරයෙකුට ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට හෝ වෙනත් කිසිවෙකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකි ය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන, ගරාජ් අංක වලින් හෝ ව්‍යාජ අංක වලින් ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු වාහන සංචිත භාර නිලධාරීන් නිසැක විය යුතු ය.

6.3 දේශපාලනමය ප්‍රචාරක කාර්යයන් සඳහා ගුවන් යානා හා හෙලිකොප්ටර් හෝ වෙනත් වාහන යොදා ගැනීම පිණිස රජයේ මුදල් වැය නොකරන බවට සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා ආයතන ප්‍රධානීන් නිසැක විය යුතු ය.

**07. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය**

7.1 රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතු ය. සාමාන්‍ය කාල සීමාව තුළදී ඕනෑම දේශපාලන පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට මුදල් ගෙවා වෙන්කර ගත හැකි ගොඩනැගිලි හා ශාලා,පාර්ලිමේන්තු මැතිවරණ කාල සීමාව තුළ නිසි පරිදි ගාස්තු අයකර කිසියම් පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට වෙනස්ව සැලකීමකින් තොරව ලබාදීමට මෙම විධාන වලින් බාධාවක් ඇති බව නොසැලකිය යුතු ය.

7.2 මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිදු දේශපාලඥයෙකුට, නිලධරයෙකුට, වෙනත් පුද්ගලයෙකුට මැතිවරණ කාලසීමාව තුළ පූර්ණ කාලීනව වෙන්කර දීමෙන් වැළකිය යුතු ය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරතවීමට ඉඩ නොදිය යුතු ය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර්, කටවුට් ආදිය ප්‍රදර්ශනය කිරීමට හෝ ගබඩා කිරීමට ද ඉඩ නොදිය යුතු ය.

7.3 රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා පිටි හෝ හිස් ඉඩම් හා ශාලා හෝ එවැනි වෙනත් ගොඩනැගිලි එක් එක් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂක ප්‍රවර්ධන ප්‍රචාරක රැස්වීම් සඳහා වෙන් කිරීමේදී කිසිදු පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ සැලකිල්ලක්, ප්‍රමුඛතාවක් හෝ අඩු සැලකිල්ලක් ලැබෙන පරිදි වෙන්කරදීම් නොකළ යුතු ය. එකී ස්ථාන, ගොඩනැගිලි වෙන්කරදීම විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතු ය.එවැනි ස්ථාන සෙසු පක්ෂයකට/ කණ්ඩායම්වලට/ අපේක්ෂකයෙකුට ලබාගැනීමට නොහැකි වන පරිදි, කිසිදු පක්ෂයකට/ කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට හෝ වෙනත් කාර්යයක් සඳහා දිගින් දිගටම වෙන්කර තැබීම නොකළ යුතු ය.

**08. පොදු කරුණු**

8.1 රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන, වාහන, බඩු බාහිරාදිය, ගොඩනැගිලි, ඉඩම් හා නිලධාරීන් මැතිවරණයට අදාළ පක්ෂ/ කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමට කිසිදු අවකාශයක් නොදිය යුතු ය. මැතිවරණය පැවැත්වෙන කාලසීමාවේ දී හදිසි රාජකාරී කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා (නැතහොත් අගතියට පත්කිරීම සඳහා) රජයේ/ රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ/ රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන වෙනත් කාර්යාලවලට හා ආයතනවලට අනුයුක්ත කිරීම් හෝ මුදාහැරීම් හෝ වැනි අකටයුතුකම් සිදුකිරීමට කිසිදු නිලධරයෙකුට ඉඩ නොදිය යුතු ය. රජයේ, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල හෝ රාජ්‍ය සංස්ථා, මණ්ඩල, රාජ්‍ය බැංකු, ව්‍යවස්ථාපිත වෙනත් ආයතන, රජයේ විශ්වවිද්‍යාල යනාදී කිසිදු රාජ්‍ය ආයතනයක් සතු මාධ්‍ය ඒකකවලට අයත් නිලධාරීන්, වාහන, උපකරණ කිසිදු පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය. සාමාන්‍ය

තත්ත්වය යටතේ යම් රාජ්‍ය ආයතනයක් සතු වේදිකා, සැරසිලි කිරීම්, උපකරණ, වාහන, ගුවන් යානා, හෙලිකොප්ටර් යානා කුලී පදනම මත ලබා දෙන්නේ නම්,මැතිවරණ කාලය තුළ එවැනි කුලියට දීම් සියලුම පක්ෂ/ කණ්ඩායම් සඳහා ලබා ගැනීමේ අවස්ථා සහිතව විනිවිදභාවයකින් යුතුව ඉටුකළ යුතු ය.

8.2 රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව හෝ යම්කිසි සංවත්සර/ අනුස්මරණ උත්සව ආදිය සඳහා හෝ ප්‍රචාරක කටයුතු සිදුකිරීම පිණිස රාජ්‍ය මුදල් වැය කරමින් රූපවාහිනී, ගුවන්විදුලි, ප්‍රවෘත්ති පත්‍ර යනාදී මාධ්‍ය හරහා දැන්වීම් විකාශය කිරීම්/ පළකිරීම් මගින් හෝ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම මගින් හෝ කිසිදු පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙකු වෙනුවෙන් ප්‍රවර්ධන කටයුතු හෝ අගතියට පත්කිරීමේ කටයුතු සිදුනොකළ යුතු ය.

8.3 සියලුම පෞද්ගලික කේබල් රූපවාහිනි නාලිකා, පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන, වෙබ් අඩවි, ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන ආයතන පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාවේ දී මැතිවරණ නීති උල්ලංඝනය නොවන පරිදි සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති මාධ්‍ය උපමාන, විධාන හා උපදෙස් චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම උක්ත සන්නිවේදන ආයතන නියාමනය කිරීමේ වගකීම පවතින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම විය යුත්තේ ය.

8.4 පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන අයුරින් වීදි පහන් කණු හා දුරකථන රැහැන් කණුවල බැනර්, පෝස්ටර්, ධජ, පතාක ප්‍රදර්ශනය හා වෙනත් සැරසිලි කිරීම වැළැක්වීම මෙන්ම පොදු මහාමාර්ග මත සහ දෙපස පදික වේදිකා මත පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අයුරින් තීන්ත ආලේප මගින් හෝ ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික පුවරු වැනි හෝ ප්‍රචාරක කටයුතු සිදු වීම වැළැක්වීමට අදාළ බල ප්‍රදේශයේ එම රාජ්‍ය දේපළ සන්තකය හෝ පාලනය හිමි රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ/ පළාත් හෝ ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ හා නගරාධිපති/ සභාපති/ නාගරික කොමසාරිස්/ ලේකම් සහ ඒ ඒ අංශ ප්‍රධානීන්ගේ වගකීම වේ. පළාත් පාලන ආයතන හා අනෙකුත් රාජ්‍ය ආයතනවලට මැතිවරණයට අදාළව ව්‍යවස්ථාවෙන් පැවරී ඇති රාජකාරි පැහැර හැරීම ද විධිවිධාන කඩ කිරීමක් සේ සැලකිය යුතු ය.

8.5 යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් මැතිවරණ කාලසීමාවට පෙර ඉදිකර ඇති හෝ ප්‍රදර්ශනය කරමින් පවතින පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනයට හේතුවිය හැකි අයුරින් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙන ඡායාරූප, ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීමට එම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ක්‍රියාකළ යුතු ය. ස්වකීය පළාත් පාලන බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානවල සිදුකර ඇති පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය ඉවත් කරවීමට පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා එකී ආයතනවල කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් ක්‍රියාකළ යුතු ය.

8.6 පාර්ලිමේන්තු මැතිවරණයේදී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපළ භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම විධාන කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතු ය. ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා මණ්ඩල හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ක්‍රියා කළ යුතු ය. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය වේ.

8.7 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම, ආදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය වියයුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(2) අනු ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ.

8.8 මෙම විධානවල සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ අමාත්‍ය කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමට අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බව ද පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කිරීම ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීම බව ද සැලකිය යුතු ය.

8.9 අදාළ වනවිට කොමිෂන් සභාවල ලේකම් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් මෙම විධාන පිළිබඳව දැනුම්වත් කිරීමට ක්‍රියාකළ යුතු ය.

8.10 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, අමාත්‍යාංශවල/ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන්, ප්‍රධාන ගණන්දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරීන් ද වන හෙයින් රජය සතු දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම අදාළ නිලධාරීන් වෙත පැවරුණු වගකීමක් වේ.

8.11 පළාත් පාලන ආයතන හා අනෙකුත් රාජ්‍ය හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සමාගම් විසින් එකී ආයතන වෙත ව්‍යවස්ථාපිතව හෝ අනිසි ආකාරයකින් පැවරී ඇති රාජකාරී පැහැර හැරීම ද හා/හෝ නොකර හැරීම ද විධාන කඩ කිරීමක් ලෙස සැළකෙයි.

8.12 මෙම විධානවලට අනුකූලව කටයුතු නොකිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උඋ ව්‍යවස්ථාව ප්‍රකාර දඬුවම් ලබාදිය හැකි වරදක් බවද සඳහන් කරනු ලැබේ.

*සැ.යු.*

මෙම විධානවල රජය යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකදී ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල, රජයට පවරා ගත් සමාගම් යන සියලුම ආයතන හා 50% කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතන ද අදහස් වේ.

රජයේ නිලධාරීන් හා සේවකයන් යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකම පෙර සඳහන් ආයතනවල සේවයේ නිරත හා මොනයම් හෝ පදනමකින් සේවයේ යොදවා ගෙන සිටින ජන රජයෙන් වේතනයක් හෝ දීමනාවක් ලබන සියලුම තැනැත්තන් අදහස් වේ.

EOG 10 - 0030

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.